# 2. සම්භාව්‍ය මාක්ස්වාදී සංහතික සංකල්පයේ විශේෂතා පිළිබඳ විමර්ශනයක්

ආචාර්ය ටියුඩර් වීරසිංහ

මෙහිදී අපගේ අවධාන යොමු වන්නේ සංහතික සංකල්පයේ සමස්ත න්‍යායික වර්ධනය පිළිබඳව නොව එය මාක්ස්වාදීය සහ මාක්ස්වාදී පර්යාලෝකයකින් ගෙන හැර දැක්වීම පිළිබඳව බව සඳහන් කළ යුතුය.

මාක්ස්වාදය විශේෂයෙන් එහි සම්භාව්‍ය ස්වරූපය හැඩගැසෙමින් හා වර්ධනය වෙමින් පැවති කාල අවකාශයක් තුළ සංහතික ප්‍රපංචයන්ගේ වර්ධනය ආරම්භ වුවද සංහතික ප්‍රපංචය සමස්ත ප්‍රපංචයක් වශයෙන් ගවේෂණය කිරීමට මාක්ස්වාදය ඉදිරිපත් නොවීය. නමුත් ප්‍රාරම්භක අවධියේ දී පවා සංහතික ප්‍රපංචවල බලපෑම සහ සමාජ දේශපාලන සංස්කෘතික දෘෂ්ටිවාදී වැදගත්කම කොතෙක් ද කියනවා නම් සංහතික ක්‍රියාවලියේ යම් යම් පැතිකඩ සහ මට්ටම් ස්පර්ශ කිරීමෙන් වැළකී සිටීමට මාක්ස්වාදයට නොහැකි වූ බව ප්‍රකාශ කළ යුතුය. මානව වර්ගයාගේ සමාජ පරිණාමය ක්‍රියාවලියේ ධනේශ්වර යුගයේ දී මානව සමාජය සංහතිකකරණය වීම පිළිබඳ අනාවරණය කළ එක් පුරෝගාමියෙක් වූයේ කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් මානව සමාජය සංහතිකරණය වීමේ ගැටලුව සහ එහි මූලයන් ධනේශ්වර සංවර්ධන යුගයේ දී සිදුවන බව ඔවුහු අවධාරණය කළහ. "තම නිෂ්පාදන භාණ්ඩවලට නියත ලෙසම ව්‍යාප්ත වෙමින් පවතික වෙළඳපොළක් සොයා ගැනීමේ අවශ්‍යතාව විසින් ධනපති පන්තිය පෘථිවි ගෝලයේ භූතලය මත හැමතැනම ලුහුබඳිනු ලබයි. එය හැම තැනෙකම කුරුල් විය යුතුය. හැම තැනකම පදිංචි විය යුතුය. හැම තැනෙකම සම්බන්ධකම් ඇති කර ගත යුතුය."[1] මේ අනුව සම්භාව්‍ය මාක්ස්වාදය පෙන්වා දෙන්නත් ධනේශ්වර ක්‍රමයේ සංවර්ධනයත්, ව්‍යාප්තියත් සමග නිෂ්පාදනයේ සහ පාරිභෝජනය සමාජයකරණය ගෝලීය පරිමාණිකව සිදුවන බවත් ඊට පෙර සාම්ප්‍රදායිකව පැවති හුදකලා සම්බන්ධතා ඒකීය සමස්තයක් ලෙසට සංවිධානය වී ජන සමාජය ඊට වඩා වෙනත් තලයකට ගමන් කරන බවත්ය. එහි ප්‍රතිඵලය වන්නත් මිනිස් සම්බන්ධතා සහ ක්‍රියාකාරකම්වල සමජාතික හා පොදු බවක් ප්‍රකට කරන බවය. " ලෝක වෙළඳ පොළ සූරාකෑම

මගින් ධනපති පන්තිය හැම රටකම නිෂ්පාදනයට සහ පරිභෝජනයට සාර්වභෞමික ස්වරූපයක් දී ඇත්තේය."[1] සමාජය සිය සංවර්ධනයේ ඕනෑම අවස්ථාවකදී එය එක් එක් පුද්ගලයින්ගේ හුදු එකතුවක් නොව, පුද්ගලයින් එකිනෙකා අතර ගොඩනගා ගන්නා සම්බන්ධතාවල පද්ධතියක් බව මාක්ස්වාදය පෙන්වා දෙයි. එම සම්බන්ධතා මිනිසුන්ගේ සාමූහික ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික අන්‍යෝන්‍ය ක්‍රියාවලියේ දී ගොඩනැගෙන අතර ඒවා ඔවුන්ගේ ජීවන ක්‍රියාකාරීත්වයේ ස්වරූප හා මාර්ග ලෙස පවතී. සමාජ සමාග්‍ර සම්බන්ධතා මානව සත්තාවේ පැවැත්මේ ආවශ්‍යයික පදනම ලෙස පවතින බව මාක්ස්වාදය අවධාරණය කරයි. සන්නිවේදනයේ සමාග්‍ර සම්බන්ධතා සැබැවින්ම සමාජ විඥානයේ පදනම වන අතර ඒ නිසාම සැබෑ ජීවිතය තුළ සමාජ විඥානයේ විවිධ ප්‍රකාශන සන්නිවේදනාත්මක ප්‍රවේශය ඔස්සේ ප්‍රකට වීම නොවැළැක්විය හැක්කකි.

ඕනෑම අවස්ථාවක දී සමාජ විඥානයේ සියලු ස්වරූපය සංඥා පාදක (වාච්‍ය හා ප්‍රතිරූපය) සන්නිවේදනය ඔස්සේ නිරූපණය වන්නේය. නමුත් මෙහිදී අවධාරණය කළ යුත්තේ බොහෝ බටහිර න්‍යායචාරීන් මෙන් මාක්ස්වාදය සන්නිවේදන භූමිකාව සමාජය තුළ නිරපේක්ෂකරණයට ලක් නොකරන අතර සන්නිවේදන සමාජ ඓතිහාසික කොන්දේසි මගින් තත්ත්වාරෝපණය කරනු ලබන සංවර්ධනය වන්නා වූ ප්‍රපංචයක් ලෙස මාක්ස්වාද සලකනු ලබයි. මාක්ස්වාදී දෘෂ්ටිකරණයට අනුව ශ්‍රමය, සමාග්‍රය, සන්නිවේදනය මානව සත්තාවේ පූර්වකොන්දේසි මෙන්ම කොන්දේසි බවත් සමාජය යනු මිනිසුන්ගේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් බවත් අවධාරණය කෙරේ. " මිනිසාට සමාජයීය පැවැත්මක් ලෙස සන්නිවේදනය ආවේණික වන්නේය."[3]

මාක්ස්වාදය තුළ සංහතික සංකල්පය දෙයාකාරයට අර්ථකථයට කර ඇති බව පෙනේ. මාක්ස්වාදය තුළ එක් අතකින් සංහතික යන සංකල්පය වියුක්ත අර්ථයකින් භාවිතයට ගෙන ඇති අතර එහිදී සංහතික ජනතාව දිළිඳු සංහතිකයින්, ශ්‍රමික සංහතික ජනතාව "කම්කරු සංහතිකයින්" එක්සත් සංහතිකයින් ආදී වශයෙන් සංහතික සංකල්පය ස්තරය යන සංකල්පයට පර්යාය පදයක් ලෙස යොදා ගෙන ඇති බව පෙනේ. මේ කාලය වන විට නවම සංහතික යන සංකල්පය සමාජ විද්‍යාත්මක සංකල්පයක් බවට පත්වී නොතිබුණි. මේ අවධිය වන විට තරුණ හේගල්වාදී කතිකාව තුළ සංහතික ප්‍රපංචය සත්‍යයට හා ප්‍රගතියට විරෝධී සංසිද්ධියක් ලෙස ආකල්පගත වී තිබුණු බව පැහැදිලිය. නමුත් මාක්ස් හා එංගල්ස් තරුණ හේගල්වාදී සංවාදය තුළ සංහතිකයින් පිළිබඳ සිය අදහස් දක්වමින් සංහතිකයින්ගේ පරිණතාවයේ මට්ටමට අනුකූල වන පරිදි සංහතිකයින් විසින් ඉතිහාසය නිර්මාණය කරන බව ප්‍රකාශ කොට සිටියහ.සම්භාව්‍ය මාක්ස්වාදය තුළ සංහතික ප්‍රපංචය තේරුම් ගන්නා දෙවන ආකාරයඩ වන්නේ සමාජයේ ජීවත් වන





වඩාත් සවිඥානික ප්‍රගතිශීලී කොටසය එය නැඹුරුවම කාලීන නිර්ධන පන්තිය හා ඊට සමීප වෙනත් සමාජ පන්තිය ද ඒ ඒ ඓතිහාසික තත්ත්වයන් තුළ සංහතික ජනතාව වශයෙන් අර්ථ දැක්වේ. මෙය බොහෝවිට ග්‍රාමීය, නාගරික දිළිඳු ජන කොටස් වන අතර සමහර විටෙක ඔවුන් සුළු ධනේශ්වර පැවැත්මක ජීවත් විය හැකිය. නමුත් විප්ලවීය ප්‍රවාරණයේ දී එම ජන කොටස් නිර්ධන පන්තිය සමග පවතින සමාජය වෙනස්කිරීම සඳහා ඉදිරිපත් විය හැකිය." පදනම් කතිකව ඓතිහාසික ක්‍රියාකාරීත්වයේ දී සංහතිකයින්ගේ ප්‍රමාණය වර්ධනය වන බව"[1] ලෙනින් පෙන්වා දුන්නේය. නමුත් මීට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් මතයක් ඕර්ටිගා ගැසෙට් (Ortga Gasset) ඉදිරිපත් කරමින් ඉතිහාසය සාදන විප්ලවීය සංහතිකයන් පිළිබඳ වූ මාක්ස්වාදී සංකල්පය ප්‍රතික්ෂේප කරයි. මාක්ස්වාදී දෘෂ්ටිවාදයේ පරිණාමයේ විශේෂයෙන් ලෙනින්වාදී අවධියේ දී බටහිර සංහතික න්‍යායන් සංහතික ජනතාවගේ විප්ලවීය ව්‍යාපාරයට එරෙහිව යොමු වී ඇති බව අදහස් කළ අතර ලෙනින්ගේ බොහෝ ප්‍රකාශන පන්තිය වෙතට වඩා සංහතික ජනතාව වෙත යොමු වී පැවතිණ. විශේෂයෙන් විප්ලවීය සමයේ දී සහ පශ්චාත් විප්ලවීය සමයේ දී ලෙනින් බහුල ලෙස ආමන්ත්‍රණය කළේ නිර්ධන පන්තියට නොව සංහතික ජනතාවට බව අවධාරණය කළ යුතුය.

ප්‍රාග් විප්ලවීය අවධියේ දී ලෙනින් මාක්ස්ගේ සමාජ විද්‍යාත්මක ප්‍රස්තුත කෙරෙහි සිය අවධානය යොමු කරමින් පන්ති සංකල්පයේ න්‍යායික පදනම අවධාරනය කළේය. නමුත් රුසියානු සමාජ යථාර්ථය සමග ප්‍රායෝගිකව මෙන්ම සංකල්පීය ගැටලුව ලෙනින් ක්‍රමානුකූලව පන්ති ප්‍රවේශයේ සිට සංහතික ප්‍රවේශය දක්වා මාරු වන්නේය. මෙහි අර්ථය නම් රුසියානු විප්ලවීය සමයේ දී එහි සම්භාව්‍ය මාක්ස්වාදී දෘෂ්ටිවාදය ගෙනහැර දක්වන ආකාරයේ සමාජ පන්තියක් නොවීය. ඇත්ත වශයෙන් සමාජ පන්ති න්‍යායේ මූලික පදනම බිහිවී වර්ධනය වූයේ බටහිර යුරෝපීය රටවල බව මතක් කළ යුතුය. මාක්ස් සහ එංගල්ස් සිය න්‍යායික ගොඩ නැගීම සිදු කළ අතර ලෙනින් ඔවුන්ගේ න්‍යායික ආලෝකනය තුළ සම්පූර්ණයෙන් වෙනස් සමාජයන් ද නිර්භයව සිට සිය න්‍යායික ගොනුකිරීම සිදු කළ බව පෙන්වා දිය යුතුය. රුසියාවේ සංහතිකයින් විසින් විප්ලවය සිදු කොට මාක්ස්වාදීන් බලයට පමුණුවන ලදි. විප්ලවය මගින් නව රාජ්‍යත්වයක් ගොඩනැගූ අතර නව රාජ්‍යයේ දෘෂ්ටිවාදය බවට මාක්ස්-ලෙනින් වාදී දෘෂ්ටිවාදය නිල වශයෙන් ස්ථාපිත කරමින් එම පන්ති විඥානය සංහතිකයින්හට ආරෝපණය කරන ලදි.

**සංහතික දෘෂ්ටිවාදයේ ප්‍රවණතා දෙකක්**

යුරෝපීය අවකාශය තුළ සංහතික ප්‍රපංච සහ ප්‍රවණතා බිහි වී වර්ධනය වූයේ ව්‍යවසායමූල තත්ත්වයන් පාදක කොට ගෙන වන අතර පෙරදිග සමාජවල

සංහතික ප්‍රපංච සහ ප්‍රවණතා බිහි වී වර්ධනය වූයේ ප්‍රජා මූල තත්ත්වයන් පාදක කොට ගෙන බව පෙන්වා දිය යුතුය. බටහිර සංහතිකයින් සරිලන ආකාරයේ බහුත්වවාදී සංහතික දෘෂ්ටිවාදයක් ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු බටහිර යුරෝපීය රටවල නිර්මාණය වූ අතර සමාජවාදී සංහතිකයින්ට සරිලන ආකාරයේ නිල ඒකීය සංහතික දෘෂ්ටිවාදයක් සෝවියට් සංගමය ඇතුළු සමාජවාදී රටවල නිර්මාණය විය. සැබෑ සමාජවාදී සමාජයේ සංහතික දෘෂ්ටිවාදයේ ස්වරූපය මාක්ස්- ලෙනින්වාදය වූ අතර සැබෑ බටහිරවාදයේ සංහතික දෘෂ්ටිවාදය බටහිරවාදී දෘෂ්ටිවාදය විය. මේ සංහතික දෘෂ්ටිවාද දෙක ස්වරූපයෙන් වෙනස් වූවත් එය සංහතික සමාජය වෙනුවෙන් ඉටු කරන භූමිකාව පොදු බව සඳහන් කළ යුතුය. ස්වරූපයෙන් සමාජවාදී සංහතික දෘෂ්ටිවාදය වඩාත් අධිපතිවාදී, ස්වරූපයක් පෙන්නුව ද හරයෙන් එය බටහිරවාදී සංහතික දෘෂ්ටිවාදය තරම් ප්‍රබල හා අධිපතිවාදී නොවේ.

20 වන සියවස මුල් භාගයේ සිට කොමියුනිස්ට්වාදී සංහතික දෘෂ්ටිවාදය යුගල ජයග්‍රහන අත්පත්කර ගනිමින් තියුණු සඵලතාවක් ප්‍රදර්ශනය කරමින් දශලක්ෂ සංඛ්‍යාත සංහතිකයින් ආකර්ෂණීය දෘෂ්ටිවාදයක් වශයෙන් ගෝලීය සංහතික දෘෂ්ටිවාද තත්ත්වයට පත්වීමේ යථාර්ථවාදී හැකියාවක් විදහා දැක්වූවද දෙවන ලෝක මහා සංග්‍රාම අවධියෙන් අනතුරුව එහි බලපෑම ක්‍රමානුකූලව හීන වන්නට වූ අතර ඒ වෙනුවට බටහිරවාදී සංහතික දෘෂ්ටිවාදය සිය ශක්‍යතා ප්‍රදර්ශනය කරමින් කොමියුනිස්ට්වාදී සංහතික දෘෂ්ටිවාදය පරාජයට පත් කරමින් වර්තමානයේ දී එය ගෝලීය සංහතික දෘෂ්ටිවාදය බවට පත්වී අවසානය. කොමියුනිස්ට්වාදී දෘෂ්ටිවාදයේ ස්වරූපයක් ලෙස මාක්ස්වාදී දෘෂ්ටිවාදය සමග බටහිරවාදී දෘෂ්ටිවාදය සන්සන්දනය කිරීමේ දී බටහිරවාදී දෘෂ්ටිවාදය තරම් අති ප්‍රබලය හා ආකර්ෂණීය දෘෂ්ටිවාදයක් මානව වර්ගයාගේ ඉතිහාසයේ බිහි වී නොමැත. වර්තමානයේ දී සංහතික දෘෂ්ටිවාදයක් ලෙස බටහිරවාදී දෘෂ්ටිවාදය ද ගැඹුරු අර්බුදයකට මුහුණ පා ඇති පා සඳහන් කළ යුතු වන්නේය. කොමියුනිස්ට්වාදී සංහතික දෘෂ්ටිවාදය බටහිරවාදී සංහතික දෘෂ්ටිවාදය අභියස පසුබැසීමට ලක්වූවද එය තවම සම්පූර්ණයෙන් විනාශ වී ගොස් නැති වර්තමාන අර්බුදාත්මක පසුබිම තුළ එය යළිත් ඒ හෝ ඊට සමීප වෙනස් ස්වරූපයකින් මතුවීමේ හැකියාව බැහැර කළ නොහැකිය.

මානව වර්ගයාගේ ධනේශ්වර සමාජ පරිණාමීය යුගයේ සිට මානවකයින්ගේ ප්‍රමාණාත්ම වර්ධනය ඔවුන් ක්‍රියාකාරකම්වල අති දැවැන්ත වර්ධනය හා ප්‍රසාරණය, සකල විධ සමාජ සන්නිවේදනාත්මක සහ සමාගම මාර්ග හා මාධ්‍යයන්ගේ ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක වර්ධනය වීම පුද්ගලයින් අතර, සමාජ පන්ති අතර, සමාජ අතර, රටවල් අතර, රාජ්‍යයන් අතර සංස්කෘතීන් අතර





ශිෂ්ටාචාර අතර පැවැති සීමා මායිම් අපැහැදිලි වීම ද, දියාරු වී යාමට නිශේධනය වී යෑමට මග පෑදුවේය. සමාජය වඩාත් ගතික, අස්ථාවර ප්‍රපංචයක් බවට පත් කළේය. මෙම සමකාලීන සංචලීය ගතික සමාජය තුළ මුඛ්‍ය භූමිකාව රඟ දක්වන සමාජ සැකැස්මක් ලෙස සංහතික දැක්විය හැකිය. ඉහත ගෙන හැර දක්වන ලද සංහතිකකරණ ක්‍රියාවලියේ ව්‍යාප්තියේ ප්‍රධාන ප්‍රතිඵලය ලෙස බිහි වූ සංහතිකයින් සුවිශේෂ සමාජ සැකැස්මක් ලෙස පෙර පැවති සම්භාව්‍ය මානව කණ්ඩායම්වලින් වෙනස් වන්නේය. ඉහත මතු කරුණු ලද නිශ්චිත ඓතිහාසික ක්‍රියාවලීන් විවිධ සමාජවල ගොයෑමේ දී එකිනෙකට සමගාමී නමුත්, එකිනෙකට සම්පාත නොවන ප්‍රපංච දෙකක් වන සංහතිකරණය සහ අංශුකරණය සිදුවන අතර මෙය එක් සුවිශේෂ ඓතිහාසික ස්වරූපයක් වන සංහතික ප්‍රපංචය උත්පාදනය කිරීමට හේතුවන බව මාක්ස්වාදය පෙන්වා දෙයි.

ඉහත කාරණාවලට අනුව පෙනී යන්නේ වර්තමාන සමාජයෙහි විවිධ ක්ෂේත්‍රවලියේ ප්‍රතිඵලයක් ලෙස විවිධ වර්ගයේ සංහතිකයින් බිහි වන බවයි. මෙම ක්‍රියාවලියේ හරය ගැඹුරින් විශ්ලේෂණය කිරීමේ දී සමාජයෙහි මිනිසුන් විවිධ වූ හුදකලා ස්වරූප විනාශයට පත් කරමින් "මම" සිට අපි දක්වා වූ සමාජ ප්‍රගමනය අර්ථවත් කරන්නේය. මෙය වර්තමාන ගෝලීය ස්වරූපයක් දක්වා සිදුවෙමින් පවතී. මාක්ස්වාදයට අනුව මෙම ක්‍රියාවලියේ පදනම් වන්නේ නිෂ්පාදන බලවේගවල වර්ධනය, විද්‍යා තාක්ෂණික ප්‍රගතිය, යටිතල පහසුකම් වර්ධනය ආදිය වන අතර එම ක්‍රියාවලිය තුළ දී මෙම ක්‍රියාවලියට අදාළ යාන්ත්‍රණයන් හා ක්‍රමවේද වර්ධනය වන බව අවධාරණය කළ යුතුය. වෙනත් වචනවලින් ප්‍රකාශකරනවා නම් සමකාලීන සංහතිකරණය සමාජය නිශ්චිත තාක්ෂණික ආර්ථික වර්ධන මට්ටමකට නගා සිටුවන්නේය.

## මාක්ස්වාදී සංහතික සංකල්පයේ විශේෂතා

මාක්ස්වාදී සංහතිකකරණ සංකල්පයේ විශේෂතාව වන්නේ එය වියුක්ත ක්‍රියාවලියක් නොව, නිශ්චිත සමාජයක් තුළ අනෙක් ඕනෑම සමාජ ක්‍රියාවලියක් සේම, සංහතිකරණය ද සිදුවන්නේ නිශ්චිත සමාජ අර්ථනීන් දේශපාලනසංස්කෘතික සහ වෙනත් ජීවන ක්‍රියාකාරී කොන්දේසි මත බව ය. ඒ අනුව ඒ ඒ සමාජවල සුවිශේෂතා සංහතික ක්‍රියාවලියේ විවිධ ස්වරූප කෙරෙහි බලපාන බව පෙන්වා දිය යුතුය. මේ අනුව ධනේශ්වර සමාජය තුළ සිදු වෙන සංහතිකරණ ක්‍රියාවලියේ විශේෂතාවල ප්‍රතිඵලයක් ලෙස එම සමාජය මානව සම්බන්ධතා අංශුකරණය වීම නොවැළැක්විය හැකි ක්‍රියාවලියකි. ධනේශවර සමාජය තුළ මේ සිදුවන සංහතිකරණය සහ අංශුකරණය අතර මූලික වෙනසක් දැකිය හැකි නොවන තරමටම එම ක්‍රියාවලීන් ප්‍රබල ලෙස අන්‍යෝන්‍ය වශයෙන් සහසම්බන්ධිත බව

සංවර්ධනය සඳහා වන සියලු මාධ්‍ය නිෂ්පාදකයන් මත සිය ආධිපත්‍යය පැ
සහ ඔවුන්ව සූරාකෑමේ මාධ්‍ය බවට විසින් පරිණාමය වන බවත්, ඒවා ශ්‍ර
කපා කොටා මිනිසෙකුගේ කැබැල්ලක් බවට පත්කොට ඔහු යන්ත්‍රයක උප
තත්ත්වයට පහත හෙළන බවත්, ඔහුගේ වැඩෙහි මන පිනවන සෑම දෙ
විනාශ කොට එය ද්වේශයට ලක්වන වෙහෙසකර ශ්‍රමයකට හරවන
ස්වායත්ත බලයක් ලෙස ශ්‍රම ක්‍රියාවලියට විද්‍යාව සමායත කර
සමානුපාතිකයෙන්ම එම ක්‍රියාවලියෙන් බුද්ධිමය විභව ඔහුගෙන් ඉවත්
ලබන බවත්" මාක්ස් අවධාරණය කළේය. මාක්ස් පුළුල් සහ ගැඹුරු අවධා
යොමු කළේ සංහතික ප්‍රපංචයේ සහ සංහතිකකරණයේ තීරණාත්මක රෙ
සමාජ භූමිකාව වෙත නොව, ඇත්ත වශයෙන්ම එවකට සංහතික ප්‍රපං
සංහතිකකරණය අදක්‍ෂතාවයේ දී මෙන් සමාජ - දේශපාලන, සංස්කෘතික - දෘ
ජීවිතය තුළ තීරණාත්මක භූමිකාව ඉටු කිරීම දක්වා වර්ධනය වී නොතිබු

මාක්ස්ගේ කාලයේ සමාජ විපරිවර්තන මූඛ්‍ය භූමිකාව කේන්
තිබුණේත් පන්ති ප්‍රපංචය කෙරෙහිය. ඒ නිසා සමාජ පන්ති ප්‍රවේශය මත
සමාජ ජීවිතය සහ ඉතිහාසය අර්ථ දැක්වීම තත්කාලීන සමාජ-ආර්ථික
මගින් තත්ත්වාරෝපිත වූ බව සඳහන් කළ යුතුය. මේ අනුව සමාජ ප
ආස්ථානයේ සිය මාක්ස් මෙන්ම එංගල්ස් ද සංතික ප්‍රපංචය සහ සංහතික
ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීම ඓතිහාසික වශයෙන් සාධාරණ බව අපගේ
නමුත් මාක්ස්ගේ ඓතිහාසික සහ සමාජ විද්‍යාත්මක මෙහෙවර වූයේ
වර්ගයාගේ සමාජ පරිණාමයේ දී සංහතික ප්‍රපංචය සහ සංහතිකර
උත්පාදනය වීමේ සහ එය ව්‍යාප්ත වීමේ ආර්ථික තර්කනය පෙන්
ධනේශ්වර සංහතික ප්‍රපංචවල සහ ධනේශ්වර සංහතිකකරණ ක්‍රියා
විශේෂතා පෙන්වා දීමත්, එම විශේෂතා ධනේශ්වර සමාජ ආර්ථික ස
සමග අභේදනීයව සම්බන්ධ බවත් පෙන්වාදීමය.

**පාදක සටහන්**

1. මාක්ස් සහ එංගල්ස් තෝරාගත් කෘති වෙළුම් හතර, වෙළුම 1, ප්‍රගති ප්‍ර
මන්දිරය, මොස්කව්, 1982, පිටුව 49.
2. එම.
3. කාල්මාක්ස් ෆ්‍රෙඩ්රික් එංගල්ස්, සම්පූර්ණ කෘති, වෙළුම 12, පිටුව 710.
4. වී.අයි ලෙනින්. තෝරාගත් කෘති වෙළුම් 10. වෙළුම1. පිටුව 399
5. Kornhausor W.The politics of mass society, London,1960
6. කාල් මාක්ස්. ෆ්‍රෙඩරික් එංගල්ස් තෝරාගත් කෘති වෙළුම් 9, වෙළුම 2, පි